# Nielsen සමාගමේ සැපයුම්කරුවන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය

2016 දෙසැම්බර්

Nielsen සමාගම අවංකභාවයේ සහ සාමාජීය වගකීමේ ඉහළම ප්‍රමිතීන්ට කැපවී සිටී. අපි ව්‍යාපාර කටයුතුවල නියැලි තුන්වැනි පාර්ශ්ව විසින් ද ඒවාට සමාන ඉහළ ප්‍රමිතීන් අත්කර ගැනීම බලාපොරොත්තු වෙමු. මෙම සැපයුම්කරුවන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය (සංග්‍රහය) මඟින් Nielsen සමාගම වෙත භාණ්ඩ හෝ සේවා සපයනඕනෑම සැපයුම්කරුවෙක්ට අදාළ වනපොදු අවශ්‍යතා දක්වයි. සැපයුම්කරුවෙක් සහ Nielsen සමාගම අතර ඇති නිශ්චිත ගිවිසුමක නියමවලට මෙම සමාන විෂයන් ආමන්ත්‍රණය කරනඅතිරේක විධිවිධාන අන්තර්ගත විය හැකිය. මෙම සංග්‍රහයේ ඇතුළත් කිසිවකින් කිසියම් ගිවිසුමක ඇති නිශ්චිත විධිවිධාන ඉක්මවා යාමට අදහස් නොකරන අතර මෙම සංග්‍රහය සහ නිශ්චිත ගිවිසුමක විධිවිධානයක් අතර අනනුකූලතාවක් ඇතිතාක් දුරට ගිවිසුමේ නියම බලාත්මක වේ. මෙම සංග්‍රහයෙන් කිසිදු නීතියක් ඉක්මවා යාමක් අදහස් නොවේ. සැපයුම්කරුවන් ක්‍රියාත්මක වනස්ථානවල සෑම අධිකරණ බලප්‍රදේශයකම ඇති අදාල සියලු නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතුය.

ඉලෙක්ට්‍රොනික කර්මාන්ත පුරවැසි සන්ධානය පිළිබඳචර්යාධර්ම සංග්‍රහය සහ ව්‍යාපාර සහ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්ම,අනුව යමින් *රැකියාවේ මූලික මූලධර්ම සහ අයිතිවාසිකම් පිළිබඳ ILO ප්‍රකාශනයේ සහ* *එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ* ඇතුළත් ප්‍රධාන ජාත්‍යන්තර මානව ප්‍රමිතීන්වලින් මෙම සංග්‍රහයේ විධිවිධාන උකහා ගෙන ඇත

## අ. ශ්‍රමය

සැපයුම්කරුවන් කම්කරුවන්ගේ මානව අයිතිවාසිකම් සුරැකීමටත් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්වලට අනුකූලව ඔවුන්ට අභිමානයෙන් සහ ගෞරවයෙන් සැලකීමටත් කැපවී සිටිති. තාවකාලික, සංක්‍රමණික, ශිෂ්‍ය, ගිවිසුම්ගත, සෘජු සේවකයින්ට සහ වෙනත් ඕනෑම වර්ගයක සේවකයෙක් ඇතුළු සියලු සේවකයින්ට මෙය අදාළ වේ.

අනිවාර්ය කම්කරු ප්‍රමිතීන්:

**1) නිදහසේ තෝරා ගත් සේවානියුක්තිය** - බලහත්කාර, බැඳුණු (ණය බන්ධනය ඇතුළු) හෝ කාල නියමිත ශ්‍රමය, වහල්භාවය හෝ පුද්ගලයින් කුට්ටනය භාවිත නොකළ යුතුය. ශ්‍රමය හෝ සේවාව සඳහා තර්ජනය, බලහත්කාරය, බලහත්කාරකම්පෑම, පැහැර ගැනීම හෝ වංචාව ආදී මාර්ගවලින් පුද්ගලයින් ප්‍රවාහනය, රැකවරණය සැලසීම, බඳවා ගැනීම, මාරු කිරීම හෝ භාර ගැනීම මෙයට ඇතුළත් වේ.

- සේවය සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ඉල්ලුම්කරු දක්ෂ භාෂාවකින් ඔවුන්ගේ රැකියාවේ නියම පිළිබඳ විස්තරයක් කම්කරුවන්ට ලබාදිය යුතුය. සංක්‍රමණික කම්කරුවන් සම්බන්ධයෙන් වනවිට කම්කරුවා ඔවුන්ගේ මුල් රටින් නික්මීමට පෙර මෙය ලබා දිය යුතුය.
- සියලු වැඩ ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබනඒවා විය යුතු වනඅතර ඕනෑම වේලාවක දී සේවයෙන් ඉවත්ව යාමට හෝ ඔවුන්ගේ සේවානියුක්තිය අවසාන කිරීමට නිදහස තිබිය යුතුය. කම්කරුවන් සේවයේ නියැලී නොසිටින විට ඔවුන්ගේ සේවාස්ථානය හෝ කුටිය හැර යාමට නිදහස තිබිය යුතු වනඅතර (උදා. වැසිකිළිය, පානීය ජලය

ආදිය වෙත ඇති ප්‍රවේශය) ඔවුන්ගේ මූලික නිදහස අයුක්තිසහගත ලෙස සීමා කිරීමට භාජනය නොවිය යුතුය.

- රජයෙන් නිකුත් කළ හැඳුනුම්පත්, විදේශ ගමන් බලපත්‍ර හෝ රැකියා බලපත්‍රය වැනි කම්කරුවන් සතු දේ නීතිය අනුව අවශ්‍ය කරන්නේ නම් මිස, සේවායෝජකයින් සහ අනුයෝජිතයින් විසින් සේවකයින්ගේ අනන්‍යතා හෝ සංක්‍රමණික ලේඛන රඳවා ගැනීම හෝ වෙනත් ආකාරයකින් විනාශ කිරීම, සැඟවීම, රාජසන්තක කිරීම හෝ සේවකයින් විසින් ඒවා වෙත ප්‍රවේශවීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.
- කම්කරුවන් සිය සේවානියුක්තිය වෙනුවෙන් සේවායෝජකයින්ගේ හෝ අනුයෝජිතයින්ගේ බඳවා ගැනීමේ ගාස්තු හෝ වෙනත් ආශ්‍රිත ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ. කම්කරුවන් විසින් එවැනි කිසියම් ගාස්තුවක් ගෙවා ඇති බවට දැන ගැනීමට ලැබුනොත් එවැනි ගාස්තු කම්කරුවා වෙත ආපසු ගෙවනු ලැබේ.

**2) බාලවයස්කාර කම්කරුවන් -** සැපයුම් දාමයේ කිසිදු අදියරක දී ළමා ශ්‍රමය භාවිත නොකළ යුතුය. “ළමයා” යන පදයෙන් වයස අවුරුදු 15ට අඩු හෝ අනිවාර්ය අධ්‍යාපනය නිමා කිරීමේ වයස හෝ රැකියාවේ නියැලි රටේ සේවය කිරීමේ අවම වයස යන දෙකෙන් වැඩි වයසට අඩු ඕනෑම තැනැත්තෙක් හඳුන්වනු ලැබේ. වයස අවුරුදු 18ට අඩු කම්කරුවන් (බාලවයස්කාර කම්කරුවන්) රාත්‍රී වැඩමුර සහ අතිකාල ඇතුළු ඔවුන්ගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි වැඩ නොකළ යුතුය. අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව ශිෂ්‍ය වාර්තා නිසි ලෙස පවත්වාගෙනයාම, අධ්‍යාපනික හවුල්කරුවන්ගේ දැඩි නිසි උද්යෝගය සහ ශිෂ්‍යයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හරහා සැපයුම්කරුවන් විසින් ශිෂ්‍ය කම්කරුවන්ගේ නිසි කළමනාකරණය සහතික කළ යුතුය. සැපයුම්කරුවන් විසින් සියලු ශිෂ්‍ය කම්කරුවන්ට සුදුසු ආධාර සහ පුහුණුව ලබාදිය යුතුය. අදාළ දේශීය නීති නොමැති අවස්ථාවල දී ශිෂ්‍ය කම්කරුවන්, ආධුනිකයින් සහ පුහුණුවන්නන් සඳහා වූ වැටුප් අනුපාතිකය අවම වශයෙන් ඒකාකාර හෝ සමාන කාර්යයන් ඉටු කරන වෙනත් පිවිසුම් මට්ටමේ කම්කරුවන්ට සමාන විය යුතුය.

**3) වැඩ කරන කාලය** - වැඩ සතිය දේශීය නීතිය මඟින් දක්වා ඇති උපරිමය නොඉක්මවිය යුතු වන අතර හදිසි හෝ අසාමාන්‍ය අවස්ථා හැරුණු කොට, අතිකාල ඇතුළුව සතියකට පැය 60කට වඩා නොවිය යුතුය. කම්කරුවන්ට සෑම දින හතකටම අවම වශයෙන් එක් දිනයක නිවාඩුවක් ගැනීමට ඉඩ දිය යුතුය.

**4) වැටුප් සහ ප්‍රතිලාභ -** කම්කරුවන්ට ගෙවනු ලබන වන්දි අවම වැටුප්, අතිකාල පැය සහ අනිවාර්ය ප්‍රතිලාභ ආදිය සම්බන්ධයෙන් ඇතුළුව සියලු අදාළ වනවැටුප් නීතිවලට අනුකූල විය යුතුය. සැපයුම්කරුවන් විසින් දේශීය නීතිවලට අනුකූලව කම්කරුවන්ට වන්දි ගෙවිය යුතුය. විනය පියවරක් ලෙස වැටුප් අඩු කිරීම සඳහා අවසර දෙනු නොලැබේ. එක් එක් ගෙවීම් කාලපරිච්ඡේදයක් සඳහා කම්කරුවන්ට ඉටු කළ වැඩ සඳහා නිවැරදි වන්දි සහතික කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කාලානුරූපී සහ අවබෝධ කර ගත හැකි වැටුප් ප්‍රකාශනයක් ලබා දිය යුතුය. තාවකාලික, පිටත් කළ සහ බැහැරින් ලබාගත් ශ්‍රමය සියලු භාවිත කිරීම් දේශීය නීතියට අනුව සිදු කළ යුතුය.

**5) කාරුණික සැලකීම** - කිසිදු ආකාරයක ලිංගික හිරිහැරය, ලිංගික අපයෝජනය, ශාරීරික දඬුවම්, මානසික හෝ ශාරීරික බලහත්කාරය හෝ වාචික අපයෝජනය ඇතුළු කම්කරුවන් දරුණු හෝ අමානුෂික සැලකීම්වලට භාජනය නොකළ යුතු වන අතර එවැනි කිසියම් සැලකීමක් පිළිබඳ තර්ජනයක් ද නොතිබිය යුතුය. මෙම අවශ්‍යතාවන්ට අනුකූල විනය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පැහැදිලිව නිර්ණය කර කම්කරුවන් වෙත සන්නිවේදනය කළ යුතුය.

**6) වෙනස්කම්වලට භාජනය නොකිරීම -** සැපයුම්කරුවන් සේවකයින්ට අභිමානයෙන් සහ ගෞරවයෙන් සැලකිය යුතු වන අතර හිරහැර සහ අපයෝජනයෙන් තොර සේවා පරිසරයක් ලබා දිය යුතුය. සැපයුම්කරුවන් සේවකයෙක්ගේ රැකියාවේ කාර්ය සාධනයට අදාළ නොවන විශේෂ ලක්ෂණ මත පදනම්ව වෙනස් ලෙස සලකනු ලබන කුලියට ගැනීමේ

හෝ සේවානියුක්ති ව්‍යවහාරවල නිරත නොවිය යුතුය. කම්කරුවන්ට ආගමික කටයුතු සඳහා යුක්තිසහගත ඉඩකඩ සැලසිය යුතුය. මෙයට අමතරව, කම්කරුවන් හෝ අනාගත කම්කරුවන් අභිමතානුකූල ආකාරයකින් භාවිත කළ හැකි වෛද්‍ය පරීක්ෂණ හෝ ශාරීරික පරීක්ෂණවලට භාජනය නොකළ යුතුය.

7) **සමාගමයේ නිදහස-** දේශීය නීතිවලට අනුව, සැපයුම්කරුවන් විසින් සියලු කම්කරුවන්ට ඔවුන් විසින්ම තෝරා ගත් වෘත්තීය සමිති ඇති කර ගැනීමටත් ඒවාට බැඳීමටත් සාමූහිකව කේවල් කිරීමටත් සාමකාමීව එක්රැස්වීමටත් ඇති අයිතියට ගරු කළයුතු වනඅතර එමෙන්ම එවැනි ක්‍රියාකාරකම්වලින් වැළකී සිටිමට සේවකයින් සතු අයිතියට ද ගරු කළ යුතුය. කම්කරුවන්ට සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට වෙනස් ලෙස සැලකීම, පලිගැනීම, බියවැද්දීම හෝ හිංසනය පිළිබඳ බියක් නොමැතිව කළමනාකාරීත්වය සමඟ වැඩ තත්ත්වයන් සහ කළමනාකරණ ව්‍යවහාර පිළිබඳව විවෘතව සාකච්ඡා කිරීමටත් අදහස් බෙදාහදා ගැනීමටත් හැකි විය යුතුය.

## ආ සෞඛ්‍යය සහ ආරක්ෂාව

සැපයුම්කරුවන් විසින් (කම්කරුවන් විභව ආරක්ෂණ උපද්‍රවවලට නිරාවරණය වීම සීමා කරන) රැකියා ආරක්ෂණය; (කම්කරු පුහුණුව සහ නිතර පුරුදුවීම ඇතුළු හදිසි අවස්ථා සැලසුම් සහ ප්‍රතිචාර ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම) හදිසි අවස්ථා සූදානම; රැකියා තුවාල වීම සහ රෝග වැළැක්වීම සහ වාර්තාකරණය; කාර්මික සනීපාරක්ෂාව (රසායනික, ජෛවවිද්‍යාත්මක හා භෞතික කාරකවලට නිරාවරණයවීම පාලනය සහ සීමා කිරීම); කය වෙහෙසා කළයුතු වැඩ සීමා කිරීම සහ බර හෝ අන්තරාකාරී යන්ත්‍ර භාවිතයේ දී ආරක්ෂාව; (පිරිසිදු වැසිකිළි පහසුකම්, පානීය ජලය හා සනීපාරක්ෂක ආහාර පිළියෙල කිරීම ඇතුළු) පිරිසිදු හා ආරක්ෂිත සේවා පරිසරයක් වෙත ප්‍රවේශය; සහ සෞඛ්‍ය හා ආරක්ෂණ තොරතුරු පැහැදිලිව සන්නිවේදනය ඇතුළු යහපත් සෞඛ්‍ය සහ ආරක්ෂණ ව්‍යවහාර ව්‍යාපාරයේ සියලු අංශවලට එකතු කිරීම අපේක්ෂා කරනු ලැබේ.

## ඇ පාරිසරික

Nielsen සමාගම සමාජ වගකීමටත් පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ එහි කාර්යභාරය ඉටු කිරීමටත් කැපවී සිටින අතර එසේ සිදු කරන ලෙසට අපි අපගේ සැපයුම්කරුවන් දිරිමත් කරන්නෙමු. අපි සියලු සැපයුම්කරුවන් බලපත්‍ර හා වාර්තාකරණ අවශ්‍යතාවන් ඇතුළු අදාළ වනසියලු පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූලවීමට නියම කරන්නෙමු. සැපයුම්කරුවන් බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමටත් ඔවුන්ගේ බලශක්ති පරිභෝජනය හා හරිතාගාර වායුව විමෝචනය අවම කිරීමටත් පිරිවැය කාර්යක්ෂම ක්‍රමවේද සොයා බැලිය යුතුය.

අපගේ නිෂ්පාදන සැපයුම්කරුවන් සඳහා අපි පහත දැක්වෙන දේ නියම කරන්නෙමු: දූෂණය වැළැක්වීම හා සම්පත් අඩු කිරීම; අන්තරාදායක ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය ආරක්ෂිත හසුරුවීම, ගබඩා කිරීම, ගෙන යාම, භාවිතය හා බැහැර කිරීම; අපජලය පාලනය කරමින් භාවිත කිරීම හා අඩු කිරීම; සහ (වාෂ්පශීලී කාබනික රසායන, එයරොසෝල, මලකෑම, අංශුමය, ඕසෝන් ක්ෂය කරනරසායන සහ දහනය වනඅතුරු ඵලඇතුළු) විෂ වායු විමෝචනය අධීක්ෂණය හා පාලනය.

## ඈ ආචාරධර්ම සහ අවංකභාවය

සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අනුයෝජිතයින් පහත දැක්වෙන කරුණු ඇතුළු ඉහළම ප්‍රමිතියේ ආචාරධර්ම පිළිපැදිය යුතුය:

1) **ව්‍යාපාර අවංකත්වය සහ අවංකගනුදෙනු**

සියලු ව්‍යාපාර ගනුදෙනුවල දී සෘජුකමේ ඉහළම ප්‍රමිති අනුගමනය කළ යුතුය. සැපයුම්කරුවන් Nielsen සමාගමේ සේවාදායකයින්, මිතුරන් සහ මිත්‍ර වෘත්තීයවේදීන්ට අදාළ වනජ්වා ද ඇතුළුව Nielsen සමාගමේ කර්මාන්තයට සහ සැපයුම්කරු විසින් Nielsen සමාගමට සේවා සපයනසියලු රටවල ව්‍යවහාර ප්‍රදේශවලට අදාළ වනචාරිත්‍ර, රීති, ව්‍යවහාර සහ චර්යා සංග්‍රහවලට ගරු කළ යුතුය.

සැපයුම්කරුවන් ඕනෑම හෝ කිසියම් ආකාරයක අල්ලස, දූෂණය, පැහැරගැනීම සහ මුදල් වංචාකිරීම තහනම් කරනඅතර ඒ සම්බන්ධයෙන් කිසිදු ලිහිල්භාවයක් දක්වනු නොලැබේ.

සියලු ව්‍යාපාර ගනුදෙනු විවෘතභාවයෙන් ඉටු කළ යුතු වනඅතර සැපයුම්කරුගේ ව්‍යාපාර පොත් හා වාර්තාවල නිවැරදිව නිරූපණය කළ යුතුය. සැපයුම්කරුවන් විසින් Nielsen සමාගම වෙත හෝ Nielsen සමාගම හෝ එහි සේවාදායකයින් සම්බන්ධ කිසියම් ගනුදෙනුවක් හෝ වැඩක් පිළිබඳව කිසියම් අසත්‍ය නියෝජන ඉදිරිපත් කිරීම හෝ අසත්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය. කරුණු පිළිබඳ අසත්‍ය ප්‍රකාශන හෝ අසත්‍ය දත්ත සැපයීම හෝ භාවිත කිරීම මෙයට ඇතුළත් වේ. සැපයුම්කරුවන් යෝග්‍ය ලෙස නිපුණතා සහිත සහ අත්දැකීම් ඇති වැඩ පමණක් භාර ගත යුතුය. සැපයුම්කරුවන් Nielsen සමාගමට සහ එහි සේවාදායකයින්ට සදාචාරමය හැසිරීම හා ගුණාත්මක නිපැයුම් හා සේවා සැපයීම සහතික කිරීම පිණිස
වෘත්තීය තුළ ඇති ව්‍යවහාර පිළිබඳ දැනුවත් විය යුතුය

සැපයුම්කරුගේ ව්‍යාපාර පරිචයන් මෙම නියමවලට අනුකූල වනබව සහතික කර ගැනීම පිණිස අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ කාර්යපටිපාටීන් ක්‍රියාත්මක කළ යුතුය.

## 2) අල්ලසෙන් තොරවීම

සැපයුම්කරුවන් එ.ජ. ඇතුළු අදාළ සියලු දේශීය සහ ජාත්‍යන්තර දූෂණ විරෝධී නීති පිළිපැදිය යුතුය. විදේශ දූෂණ ව්‍යවහාර පනත සහ එක්සත් රාජධානි අල්ලස් පනත අල්ලස් හෝ අයුතු හෝ අනිසි වාසි ලබා ගැනීමේ වෙනත් ක්‍රම පොරොන්දු නොවිය යුතුය, පිරිනොනැමිය යුතුය, අවසර නොදිය යුතුය, නොදිය යුතුය නැතහොත් භාර නොගත යුතුය. ව්‍යාපාර අත්කර ගැනීම හෝ රඳවා ගැනීම, ව්‍යාපාර වෙනත් තැනැත්තෙක් වෙත යොමු කිරීම හෝ වෙනත් ආකාරයකින් අනිසි වාසියක් ලබාගැනීම පිණිස සැපයුම්කරුවන් ද වටිනා කිසිවක් පොරොන්දු නොවිය යුතුය, පිරි නොනැමිය යුතුය, අවසර නොදිය යුතුය, නොදිය යුතුය නැතහොත් භාර නොගත යුතුය.  සාමාන්‍ය රජයේ කාර්යයක කාර්යසාධනය ඉක්මන් කරවා ගැනීම පිණිස ගෙවීම් සඳහා පහසුකම් සැලසීම ද තහනම් වේ. සැපයුම්කරුවන් ඉහත දක්වා ඇති පරිදි සැපයුම්කරුවන් විසින් සෘජුව කිරීම තහනම් කර ඇති කිසිවක් කිරීම සඳහා තුන්වැනි පාර්ශ්වයක් යෙදවීම ද නොකළ යුතුය.

## 3) තොරතුරු හෙළිදරව් කිරිම

සැපයුම්කරුගේ ශ්‍රමය, සෞඛ්‍ය හා ආරක්ෂාව, පාරිසරික ව්‍යවහාර, ව්‍යාපාර කටයුතු, ව්‍යුහය, මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය පිළිබඳ තොරතුරු අදාළ වනනීති හා රෙගුලාසි සහ පවතින කර්මාන්ත ව්‍යවහාරවලට අනුව හෙළිදරව් කළ යුතුය. සැපයුම්කරුවන් ඔවුන්ගේ හෙළිදරව් කිරීම්වලින් ක්‍රියාකාරකම් වරදවා විස්තර නොකළ යුතුය.

## 4) බුද්ධිමය දේපළ

සැපයුම්කරු විසින් එහි තොරතුරු පද්ධතිය අවසර ප්‍රවේශයෙන් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කළ පරිපාලන, භෞතික හා තාක්ෂණික ආරක්ෂණ ඇතුළු ආරක්ෂක සුරැකිතාවන් ක්‍රියාත්මක හා නඩත්තු කළ යුතු වනඅතර Nielsen සමාගමට හානිකර විය හැකි ආකාරයකින් එහි පද්ධතිය අන්තරායකට පත්ව තිබෙන බවට විශ්වාස කරන්නේ නම් වහාම Nielsen සමාගම වෙත දැනුම් දිය යුතුය.
සැපයුම්කරුවන් Nielsen හි රහස්‍ය තොරතුරු, දත්ත, වෙළඳ තොරතුරු, කර්තෘ අයිතිය හා වෙළඳ ලකුණු Nielsen සමාගම සමඟ ඇති ඔවුන්ගේ ගිවිසුම යටතේ අවසර දී ඇති ආකාරයට පමණක් භාවිත කළ යුතු වනඅතර අවම වශයෙන්

යුක්තිසහගත මට්ටමක සැලකිල්ලකින් එවැනි තොරතුරු ආරක්ෂා කළයුතුය. සැපයුම්කරුවන් වෙනත් අයගේ වෙළඳ තොරතුරු, වෙළඳ ලකුණු හෝ කර්තෘ අයිතිය අති වැඩ අයුතු ලෙස අත්පත් කර ගැනීම හෝ උල්ලංඝනය නොකළ යුතුය. සැපයුම්කරුවන් විසින් වෙළඳ රහස් හෝ අනෙක් අයගේ හිමිකාරත්වය ඇති හෝ රහස්‍ය තොරතුරු අනිසි ලෙස භාවිත නොකළ යුතු වනඅතර එවැනි තොරතුරු අවසර නොලද තුන්වැනි පාර්ශ්වවලට හෙළිදරව් නොකළ යුතුය. සැපයුම්කරුවෙක් හෝ තුන්වැනි පාර්ශ්වයක් විසින් Nielsen සමාගමේ දත්ත, වෙළඳ රහස්, ලාංඡන හෝ රහස්‍ය තොරතුරු අනවසර ලෙස භාවිත කිරීම පිළිබඳව සැපයුම්කරුවන් විසින් Nielsen සමාගම වෙත වහාම දැනුම්දිය යුතුය.

**5) අනන්‍යතාව ආරක්ෂා කිරීම සහ පලිනොගැනීම**

සැපයුම්කරු එක්කෝ (i) මෙම සංග්‍රහය උල්ලංඝනය කිරිම් හෝ Nielsen සමාගමේ වැඩ සම්බන්ධ ඍජුභාවය පිළිබඳ කිසියම් තැවුල් වාර්තා කිරීම සඳහා සිය සේවකයින් සඳහා දූෂණ වංචා හෙළිදරව් කිරීමේ[1] ඍජු දුරකථනයක් හෝ සමාන ක්‍රියාපටිපාටියක් පවත්වා ගෙන යාම හෝ (ii) එහි සේවකයින්ට [Nielsen සමාගමේ දූෂණ වංචා හෙළිදරව් කිරීමේ ඍජු දුරකථනය භාවිත කිරීමට ඉඩ දීම කළයුතුය](). සැපයුම්කරු, නීතියෙන් තහනම් කර ඇත්තේ නම් මිස, සැපයුම්කරුගේ සහ සේවකයාගේ රහස්‍යභාවය, නිර්නාමිකත්වය හා ආරක්ෂාව සහතික කිරීමට වැඩසටහන් පවත්වා ගෙනයා යුතුය. මේ අවස්ථා දෙක අතුරින් ඕනෑම අවස්ථාවක දී, මෙම චර්යාධර්ම සංග්‍රහය උල්ලංඝනයවීමක් ආශ්‍රිතව සැපයුම්කරුට ලැබෙන කිසියම් තොරතුරක් හෝ චෝදනාවක් Nielsen සමාගම වෙත වහාම වාර්තා කිරීමේ ප්‍රතිජානන බැඳීමක් සැපයුම්කරුට ඇත. කිසියම් සේවකයෙක් හෝ තුන්වැනි පාර්ශ්වයක් විසින් Nielsen සමාගමට එරෙහිව කිසියම් හිමිකම්පෑමක් හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවට සැපයුම්කරුවෙක්ට දැනගැනීමට ලැබුණහොත් සැපයුම්කරු විසින් Nielsen සමාගමට වහාම දැනුම් දිය යුතුය. Nielsen වෙත කරනසියලු වාර්තා කිරීම් සිදු කළයුත්තේ Integrity@Nielsen.com හෝ [https://nielsen.tnwreports.com/](https://nielsen.tnwreports.com/)

**6) බණිජ වගකීම් සහගතව සැපයීම**

සැපයුම්කරුවන් නිෂ්පාදනය කරනු ලබනනිපැයුම්වල ඇති ඛණිජ, බරපතලමානව අයිතිවාසිකම් අපයෝජන සඳහා වැරදිකරුවන්ට ඍජුව හෝ වක්‍රව මුදල් නොසපයන බවට හෝ ප්‍රතිලාභ නොසලසන බවට යුක්තිසහගතව සහතික කර ගැනීම සඳහා සැපයුම්කරුවන් සතුව ප්‍රතිපත්තියක් තිබිය යුතුය. සැපයුම්කරුවන් මෙම ඛණිජවල භාරකාරත්වය මූලාශ්‍රය හා දාමය හඳුනා ගැනීමේ දී නිසි උද්යෝගයෙන් කටයුතු කළයුතු වනඅතර ගනුදෙනුකරුගේ ඉල්ලීම මත ඔවුන්ගේ නිසි උද්යෝගී ක්‍රියාමාර්ග ඔවුන්ට ලබා දිය යුතුය.

**7) පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂාව**

Nielsen මඟින් ලබා දුන් හෝ Nielsen සමාගම හෝ එහි සේවාදායකයින් වෙනුවෙන් සැපයුම්කරු ලබා ගත් දත්ත ("Nielsen දත්ත") ආරක්ෂා කිරීම සඳහා යුක්තිසහගතව සකස් කළ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සැපයුම්කරුවන් විසින් පවත්වා ගෙනයා යුතුය. සැපයුම්කරුවන් Nielsen දත්ත එක්රැස් කිරීම, ගබඩා කිරීම, සකස් කිරීම, සම්ප්‍රේෂණය කිරීම හෝ හෙළිදරව් කිරීම පිළිබඳ සියලු අදාළ පෞද්ගලිකත්ව, දත්ත ආරක්ෂණ සහ තොරතුරු ආරක්ෂණ නීති හා රෙගුලාසි සහ අධිකරණ නියමයන් පිළිපැදිය යුතුය. සේවා සපයන්නන් සමඟ ක්‍රියාත්මක කිරීම පිණිස හෝ උපකොන්ත්‍රාත්කරුවන් වෙත ගලා යාම පිණිස අදාළ නීති මඟින් Nielsen සමාගමට හෝ එහි සේවාදායකයින්ට නියම කර Nielsen සමාගම සමඟ ඕනෑම ආකාරයකින් එළැඹ තිබෙන සුදුසු දත්ත මාරු කිරීමේ ගිවිසුම් සැපයුම්කරුවන් විසින් ක්‍රියාත්මක කළයුතුය. Nielsen දත්ත සකස් කිරීම සඳහා නව උප-කොන්ත්‍රාත්කරුවෙක් යොදවා ගැනීමට පෙර සැපයුම්කරුවෙක් විසින් Nielsen සමාගම වෙත අවම වශයෙන් දින 30කදැනුම්දීමක් සිදු කළයුතු වනඅතර Nielsen දත්ත සකස් කිරීමට කිසියම් උප-කොන්ත්‍රාත්කරුවෙක්ට අවසර දිමට පෙර Nielsen සමාගමේ කැමැත්ත ලබා ගතයුතුය

---

[1] දූෂණ වංචා හෙළිදරව් කරන්නා අර්ථ නිරූපණය: සමාගමක සේවකයෙක්ගේ හෝ නිලධාරියෙක්ගේ හෝ රාජ්‍ය නිලධාරියෙක්ගේ හෝ නිල අධිකාරයක අනිසි හැසිරීම පිළිබඳව හෙළිදරව්වක් කරනු ලබනඕනෑම තැනැත්තෙක්.

**8) බැඳියා පිළිගැටුම**

සැපයුම්කරුවන් විසින් Nielsen සමාගමේ අයිතීන් සමඟනුසුදුසු ගැටීමක් හෝ ගැටීමක පෙනීමක් ඇති කළ හැකි කිසියම් අවස්ථාවක් හෝ සම්බන්ධතාවක් වළක්වා ගතයුතුය. සැපයුම්කරුවන් විසින් Nielsen සමාගමේ කිසියම් සේවකයෙක්ට හෝ Nielsen සමාගමේ සේවකයින්ගේ පවුලේ සාමාජිකයින්ට මිල අධික ත්‍යාග, ආගන්තුක සත්කාර හෝ විනෝදසංග්‍රහ පිරිනැමීම හෝ ලබා දීම නොකළ යුතුය. Nielsen සමාගමේ සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් Nielsen සමාගම සමඟව්‍යාපාර කටයුතු සිදු කරනඕනෑම ආයතනයක් පිළිබඳව විශේෂ ආර්ථික උනන්දුවක් ඇතිව නොසිටිය යුතු වන අතර Nielsen සමාගමේ සේවකයින් අතර ගැටීමක් හෝ ගැටීමක පෙනීමක් ඇති කළ හැකි සම්බන්ධතා වැළැක්විය යුතුය.

## ඉ. කළමනාකරණ පද්ධතිය

සැපයුම්කරුවන් විසින් පහතදැක්වෙන කරුණු සහතික කර ගැනීමට සකස් කළ කළමනාකරණ පද්ධතියක් යොදා ගැනීම හෝ ස්ථාපනය කළ යුතුය:

1) සැපයුම්කරුගේ මෙහෙයුම් හා නිපැයුම්වලට සම්බන්ධ අදාළ නීති, රෙගුලාසි සහ පාරිභෝගික අවශ්‍යතාවලට අනුකූලවීම;
2) මෙම සංග්‍රහයට අනුකූල වීම; සහ
3) මෙම සංග්‍රහයට සම්බන්ධ මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම. එමගින් අඛණ්ඩ වැඩිදියුණුවට පහසුකම් සැලසීම ද කළ යුතුය.

## ඊ. චර්යාධර්ම සංග්‍රහයට සිදු කරනවෙනස් කිරීම්

Nielsen සමාගමේ සැපයුම්කරුවන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය යාවත්කාලීන කිරීමේ, වෙනස් කිරීමේ අයිතිය Nielsen සමාගම සතු වනඅතර සැපයුම්කරුවන් විසින් එම වෙනස් කිරීම් පිළිගෙන, ඒ අනුව කටයුතු කළ යුතුය. සැපයුම්කරුවන් නිකුත් කළ ඕනෑම ලේඛනයක අන්තර්ගත කිසිවකින් මෙම සංග්‍රහයේ කිසිදු කොටසක් වෙනස් කරනබවට හෝ සංශෝධනය කරනබවට සලකනු නොලැබේ.